# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/08/PM/04/EM.POWER-2026 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................................ | දිනය<br>திகதி<br>Date | 2026.01.09 |
|---|---|---|---|---|---|

**සමෘද්ධි චක්‍රලේඛ අංක: 2026/01**

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,**
**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,**
**ප්‍රාදේශීය ලේකම්වරුන්,**
**නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්**

**<u>අස්වැසුම ප්‍රතිලාභ ලබන දුප්පත් ,අන්ත දුප්පත් හා අවදානමට ලක් වූ සමාජ කාණ්ඩයන්ට අයත් ප්‍රතිලාභ පවුල් වලින් සවිබලගැන්වීමට කැමැත්ත දක්වන එකඟතා ලිපිය ලබාගැනිම හා හඳුනාගත් ප්‍රතිලාභී පවුල් සඳහා පවුල් සංවර්ධන සැලැසුම් සකස් කිරීම - 2026</u>**

**01.** **කැමැත්ත ප්‍රකාශ කිරිමේ එකඟතා ලිපියක් ලබාගැනීම**

i. අස්වැසුම සුභසාධක යෝජනා ක්‍රමය යටතේ, ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන අමාත්‍ය මණ්ඩල තීර්ණයක් මත 2024 වර්ෂයේ දී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා දී ඇත. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහනක් සකස් කර දිස්ත්‍රික්ක, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර, ඒ අනුව සුදුසු ප්‍රතිලාභී පවුල් 2025 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා වසරින් වසර කණ්ඩායම් වශයෙන් හඳුනාගැනීමත්, එකී පවුල් ආර්ථික, සමාජීය හා මානසික යන ක්ෂේත්‍රයන් යටතේ සවිබලගැන්වීමට කටයුතු කරමින් සිටී.

2026 වර්ෂයේ සිට ඉදිරි වර්ෂවලදී සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ, සවිබලගැන්වීමට සුදුසු සියළුම අස්වැසුම ප්‍රතිලාභීන්ගෙන් එකඟතා ලිපියක් ලබාගැනිමට තීරණය කර ඇත.

ii. එම එකඟතා ලිපිය, අස්වැසුම ප්‍රතිලාභ ලබන දුප්පත්, අන්ත දුප්පත් හා අවදානමට ලක් වූ සමාජ කණ්ඩයන්ට අයත් පවුල් අතරින්, පහත සුදුසුකම් සහිත පවුල් වලින් පමනක් අත්සන්කර ලබාගත යුතුය. “පවුලේ සමාජිකයින් 02 ට අඩු හෝ 02 ට වැඩි සංඛ්‍යාවක් සිටින හා ඵලදායි ආර්ථික කාර්යයක නිරත විය හැකි, අවුරුදු 16-60 අතර වයස් කාණ්ඩයේ එක් පුද්ගලයකුවත් සිටින ප්‍රතිලාභී පවුලක් වීම” .

iii. එකඟතා ලිපියේ අකෘතියක් ඇමුණුම -01 සමඟ අමුණා ඇත.

iv. එකඟතා ලිපිය ලබාගැනීමේ කාර්යයේ පළමු පියවර වශයෙන්, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් නිකුත් කල දැනට අස්වැසුම ප්‍රතිලාභ ගෙවන ප්‍රතිලාභී පවුල් නාම ලේඛනයෙන් සුදුසු ප්‍රතිලාභී පවුල් හඳුනාගැනීම කල යුතුය. ග්‍රාම නිළධාරි වසම්හි සේවය කරන සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සතුව , ප්‍රතිලාභී නාමලේඛණයක් නොමැති නම් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ https://crm.esamurdhi.gov.lk වෙබ් අඩවියට තොරතුරු තාක්ෂණ අංශය මඟින් අදාල සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ට ලබා දී ඇති පරිශිලක නාමය හා මුරපදය භාවිතා කර, ඇතුල් වී ප්‍රතිලාභී නාම ලේඛණයක් ලබාගන්නා ලෙස දන්වමි. මේ සඳහා දිස්ත්‍රික් A+ නිළධාරීන්ගේ හා සමෘද්ධි බැංකු කළමනාකරුවන් ගේ සහාය ලබාගත හැකිය.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

v. ඉන් අනතුරුව, සමෘද්ධි සංවර්ධන නිළධාරීන් විසින්, ඉහත සුදුසුකම් සහිත එක් එක් ප්‍රතිලාභී පවුල් පෞද්ගලිකව හමු වී සවිබලගැන්වීම් වැඩසටහන පිළිබඳව පැහැදිලි කිරීම් කර දී, එකඟතා ලිපිය (ඇමුණුම-01) කියවා/කියවා දී ප්‍රතිලාභියාගේ අත්සන ලබාගත යුතුය.

මෙහිදී, 2025 වර්ෂයේ සවිබලගැන්වීමට එකඟතාවය ලබාදී තෝරාගත් හා ADB, World Bank නියමු ව්‍යාපෘති සඳහා අතුලත් වී ඇති ප්‍රතිලාභීන් හැර අනිකුත් සුදුසුකම් සහිත අස්වැසුම ප්‍රතිලාභ ලබන සියළුම ප්‍රතිලාභීන්ගේ එකඟතා ලිපිය ලබාගැනීම සිදුකල යුතුය.

vi. ඉහත සුදුසුකම් ලැබූ ප්‍රතිලාභියකු හෝ පවුලක් සවිබලගැන්වීම් වැඩසටහනට සම්බන්ධ වීමට අකමැත්ත ප්‍රකාශ කරන විටක, එයට හේතුව පහත සඳහන් එකක් (01) නම් ඒ පිළිබඳ එකඟතා ලිපියේ හේතුව හා අංකය සඳහන් කර, අත්සන ලබාගත යුතුය. ඉන් අනතුරුව එම හේතුව ද EIS තොරතුරු පද්ධතියට ඇතුල් කිරීම කල යුතුය.

සවිබලගැන්වීමේ වැඩසටහනට සම්බන්ධවීමට අකමැති වීමට හේතු

1. සවිබලගැන්වී සිටීම.
2. ප්‍රතිලාභියා මියගොස් සිටීම.(නාම ලේඛයේ නම ඉවත් නොවීම හා පවුලේ වෙනත් සුදුසුකම් ලත් සමාජිකයන් නොමැති වීම ආදිය.)
3. සවිබලගැන්වීම් වැඩසටහනට ඇතුල් කර ගැනීමට නුසුදුසු වීම.
   **නිදසුන්-** ස්ථිර පදිංචිය නොමැති වීම, දරුවන් රැකියාවල නිරතවීම ආදිය
4. පුද්ගලිකව සවිබලගැන්වීමේ කාර්යයට සම්බන්ධ වීමට ඇති අකැමැත්ත.
5. මූල්‍යාධාර/ණය පහසුකම් ලබාගැනීමට නොකැමැත්ත.

vii. ඉහත පරිදි එකඟතා ලිපිය ලබාගත් එක් එක් ප්‍රතිලාභියාගේ කැමැත්ත/අකමැත්ත, **Empower IS** තොරතුරු කළමනාකරණ පද්ධතියට ඇතුල් කිරීම කල යුතුය. දැනටමත් තොරතුරු කළමනාකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය, ප්‍රවේශය හා තොරතුරු ඇතුලත් කිරීම සම්බන්ධව A+ නිළධාරීන් හරහා වසම් මට්ටමින් නිළධාරීන්ව දැනුවත් කර ඇත.
ඒ අනුව, නිළධාරියා විසින් තම ස්මාර්ට් (Smart) වර්ගයේ දුරකථනයක් හරහා හෝ සමෘද්ධි බැංකුව/බැංකු සමිතිය සතු අන්තර්ජාල පහසුකම් සහිත පරිගණයක් භාවිතා කර අදාල පද්ධතියට ඇතුල් වී දත්ත හා තොරතුරු ඇතුල් කිරීම කල යුතුය. මෙම පරිගණක පහසුකම් ලබාදීම සමෘද්ධි බැංකු, බැංකු සමිති කළමනාකරුවන් විසින් සිදුකල යුතුය.
මෙම තොරතුරු ඇතුල් කිරීමේ දී, තොරතුරු තාක්ෂණ නිලධාරීන් විසින් සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ට ලබා දී ඇති මගපෙන්වීම් අනුව කටයුතු කරන ලෙසත්, ගැටළු හා දෝෂ ඇතිවන විටකදී දිස්ත්‍රික් A+ නිළධාරීන්ගේ සහාය ලබා ගන්නා ලෙසත් දන්වමි.

viii. කැමැත්ත පලකරන ප්‍රතිලාභීන්ගේ එකඟතා ලිපිය ලබාගැනීම හා පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීම 2026.01.31 දිනට පෙර අවසන් කල යුතු අතර,ඉන් අනතුරුව, එකඟතා ලිපි ගොනුකර සමෘද්ධි සංවර්ධන නිළධාරීන් විසින් මුලස්ථාන කළමනාකරු වෙත භාරදිය යුතුය.

**02. 2026 වර්ෂයට පවුල් ඉලක්කය හා පවුල් හඳුනාගැනීමේ නිර්ණායක**

2026 වර්ෂය සඳහා අස්වැසුම ප්‍රතිලාභී පවුල් 200,000 ක් සවිබලගැන්වීම ජාතික ඉලක්කය වේ. දිස්ත්‍රික්ක ඉලක්ක සකස් කිරීමේ දී, එක් එක් සමාජ කාණ්ඩ හා ප්‍රතිලාභ පවුල් ප්‍රතිශතයන් ඇතුලත් වන පරිදි ගණනය කිරීම් කර ඇත.
ඒ පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත. ප්‍රාදේශිය හා ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් ඉලක්ක සකස් කිරීමටද මෙම සමාජ කාණ්ඩයන් හා ප්‍රතිශතයන් එලෙසින් උපයෝගී කර ගත යුතුය.

| සමාජ කාණ්ඩය | ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව | තෝරාගත් ප්‍රතිශතය |
|---|---|---|
| අන්ත දුප්පත් | 51,210 | 25% |
| දුප්පත් | 119,490 | 60% |
| අවදානමට ලක් වූ | 29,300 | 15% |
| එකතුව | 200,000 | 100% |

## i. දිස්ත්‍රික්ක ඉලක්කය

දිස්ත්‍රික්කයේ අස්වැසුම ප්‍රතිලාභ ලබන මුළු පවුල් සංඛ්‍යාව අනුව, එක් එක් දිස්ත්‍රික්ක සඳහා හිමිවන ප්‍රතිලාභී පවුල් ඉලක්ක සංඛ්‍යාව ගණනය කර ඇමුණුම - 02 සමඟ ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව, දිස්ත්‍රික්කයට වෙන් කර දී ඇති ඉලක්ක පවුල් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමට වෙන් කර දීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් සිදු කල යුතුය.

## ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ඉලක්කය

දිස්ත්‍රික්කය සඳහා ලබාදෙන ඉලක්කය, තම දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා වෙන වෙනම ඉලක්ක සකස් කර ලබාදීම සිදු කළ යුතුය.මෙහිදී, එක් එක් කොට්ඨාශයේ අස්වැසුම ප්‍රතිලාභ ලබන දුප්පත් , අන්ත දුප්පත් හා අවදානමට ලක් වූ පවුල් සංඛ්‍යාව, ග්‍රාම නිලධාරී වසම් ගණන, සම්පත් හා අනෙකුත් පහසුකම් වල ව්‍යාප්තිය වැනි සාධක සියල්ල හෝ කිහිපයක් පදනම් කරගෙන ඉලක්ක සකස් කරන ලෙසත් දන්වමි.

## iii. ග්‍රාම නිලධාරී වසමේ ඉලක්කය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා වෙන්කර දී ඇති ඉලක්ක පවුල් සංඛ්‍යාව, ග්‍රාම නිලධාරී වසම් අතරේ වෙන් කර ලබාදීම ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සිදුකල යුතුය. මෙහිදි, සියළුම සමාජ කාණ්ඩයන් හා දී ඇති ප්‍රතිශතයන් ඇතුලත් වන පරිදි, අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව, සම්පත් හා අනෙකුත් පහසුකම්හි ව්‍යාප්තිය වැනි සාධක සියල්ල හෝ කිහිපයක් පදනම් කරගෙන ඉලක්ක බෙදා දීම සිදු කල යුතුය.

ජාතික වැඩසටහන යටතේ ග්‍රාම නිළධාරි වසම් සඳහා ඉලක්ක ලබාදීමේ දි, ADB හා World Bank මුලාධාර වැඩසටහන ක්‍රියාත්මක ග්‍රාම නිලධාරී වසම් සඳහාද ඉලක්ක ලබා දීම සිදු කල යුතුය. මෙහි දි, සුදුසු අස්වැසුම ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ දි, නියමු වැඩසටහන සඳහා දැනටමත් බඳවාගත්(Intake) හා පාලන කණ්ඩායමට (control Group) ඇතුලත් වී ඇති ප්‍රතිලාභීන් හැර අනිකුත් ප්‍රතිලාභීන් අතරින් සුදුසු පවුල් 2026 වර්ෂයට තෝරාගත යුතුය.

යම් වසමක එක් එක් සමාජ කාණ්ඩයකින් ප්‍රතිලාභීන් තෝරාගැනීමට ප්‍රමාණවත් ප්‍රතිලාභී පවුල් නොමැති නම්, ප්‍රතිශතයන් නොසලකා අනිත් සමාජ කාණ්ඩ වලින් පවුල් තෝරාගැනිමට ඉඩදෙනු ලැබේ.

## iv. ග්‍රාම නිළධාරී වසමක වැඩබලන නිළධාරියකු සේවය කරන විටක, වසමට ඉලක්ක ලබාදීම

ග්‍රාම නිළධාරී වසම්හි වැඩබලන නිළධාරීන් සිටින විටක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉලක්කය සම්පූර්ණ වන පරිදි වඩාත් සුදුසු ඉලක්ක පවුල් සංඛ්‍යාව ලබාදීම ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකල යුතුය.

## v. ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් සවිබලගැන්වීමට සුදුසු පවුල් හඳුනාගැනීමේ නිර්ණායක.

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් නිකුත් කර ඇති දැනට ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභී නාම ලේඛනයෙන් ඉලක්ක පවුල් සංඛ්‍යාව හඳුනාගැනීමට පහත 01හා 02 නිර්ණායක සමඟ අනිකුත් නිර්ණායක අතරින් එකක්වත් (01) සම්පූර්ණ කරන පවුල් 2026 වර්ෂයට සවිබලගැන්වීමට හඳුනාගත යුතුය.

මෙහිදි, අනිකුත් නිර්ණායක සලකා බැලිමේදී යොමුකිරීමට අපේක්ෂිත ස්වංරැකියාව හෝ රැකියා අවස්ථාව පිළිබඳව ද අවධානය යොමුකල යුතුය.

1. තෝරාගන්නා පවුල අස්වැසුම ප්‍රතිලාභ ලබන දුප්පත්, අන්ත දුප්පත් හා අවදානමට ලක් වූ සමාජ කාණ්ඩයන්ට අයත් හා සවිබලගැන්වීමට කැමැත්ත දැක්වූ පවුලක් වීම.
2. තෝරා ගන්නා පවුලෙහි , වයස අවුරුදු 16- 60 අතර ක්‍රියාශීලි එක් අයෙකු හෝ වැඩි සංඛ්‍යාවක් සිටීම. මෙහිදි, වයස අවුරුදු 16ට වැඩි දරුවන් ඇතුලත් කරන විටක, පාසැල් හැර ගිය හා අවිවාහක දරුවන් පමණක් සලකා බැලිය යුතුය.

3. දැනටමත් කිසියම් ස්වයං රැකියාවක / ආදායම් උත්පාදන ව්‍යාපෘතියක නිරත වන හෝ අළුතින් ස්වයං රැකියාවක් / ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන අයෙකු හෝ පවුලක් වීම.

4. පවුලේ සාමාජිකයකු වයස අවුරුදු 16-45 ත් අතරේ පසුවන හා වෘත්තීය පුහුණුවකින් පසුව දේශීය / විදේශීය රැකියාවකට යොමු වීමට කැමැත්ත තිබීම.
මෙහිදී, වෘත්තීය සුදුසුකමක් නොමැති නමුත් පුහුණුව / කුසලතා / හැකියාව දැනටමත් ඇති පුද්ගලයන් සිටින පවුලක යම් පුද්ගලයෙකු (ඔහු/ඇය) සඳහා වෘත්තීය සුදුසුකම් ලබා දීමට (RPL Method) වයස අවුරුදු 60 දක්වා සලකා බැලිය හැක.

**vi. හඳුනාගත් පවුල්වල මූලික තොරතුරු රැස්කිරීම හා පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම.**

1. 2026 වර්ෂයේ සවිබලගැන්වීමට හඳුනාගත් සෑම ප්‍රතිලාභී පවුලක් සඳහා මූලික තොරතුරු හා පවුල් සංවර්ධන සැලසුමක් සකස් කල යුතුය. ඒ සඳහා ඇමුණුම - 03 ආකෘතිය භාවිතා කල යුතුය.
2. මෙම තොරතුරු හා සැලසුම් සකස් කිරීම හඳුනාගත් ප්‍රතිලාභී පවුල් හමුවී සාකච්ඡා කර , තොරතුරු රැස් කිරීම හා පිළියෙල කිරීම සිදු කල යුතුය.
3. විශේෂයෙන්, ආර්ථික, සාමාජීය හා මානසික ක්ෂේත්‍රයන් යටතේ එකී පවුල් සඳහා සිදුකල යුතු බලගැන්වීම් කාර්යයන් පිළිබඳ වඩාත් සුපරික්ෂාකාරීව සොයා බැලිය යුතුය.
මෙහිදී, ව්‍යාපාර අවස්ථාවක/වෘත්තීය පුහුණුවකින් පසු රැකියාගත වන විටක පවුල් සංවර්ධන සැලැස්මෙහි ස්වංරැකියාව/රැකියා මාර්ගය පිළිබඳ සඳහන් කිරීමේදී, පහත උපදෙස් අනුව තොරතුරු කළමනාකරන පද්ධතිය (EIS) හරහා ජීවනෝපාය මාර්ගය හා රැකියාගත කිරීම/පුහුණු අවස්ථාව පිළිබඳ විස්තර සඳහන් කල යුතුය.

   i. ජීවනෝපාය අංශය යටතේ ස්වංරැකියාව තෝරා ගත් විටක, පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර 06 න් 01 ක් පළමුව සඳහන් කිරීම හා ඊළඟට අනු ක්ෂේත්‍රය EIS පද්ධතියෙන් තෝරා ගැනීම කළ යුතුය.
      - කෘෂි කාර්මාන්තය
      - පශු සම්පත්
      - ධීවර කටයුතු
      - නිෂ්පාදනය
      - අලෙවිකරණය
      - සමෘද්ධි සුවබෝජුන් හල්

නිදසුන:- ප්‍රතිලාභීයෙකු ස්වයං රැකියාව ලෙස අඹ වගාව තෝරා ගත් විටෙක, කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය යටතේ අඹ වගාව අනු ක්ෂේත්‍රය ලෙස තෝරා සඳහන් කළ යුතුය.

   ii. රැකියාගත කිරීම/පුහුණු අවස්ථාව සඳහා ක්ෂේත්‍රයන් සඳහන් කිරීමේ දී, EIS පද්ධතියේ සඳහන් කර ඇති රැකියා අවස්ථා තෝරා සඳහන් කල යුතුය.

මේ සම්බන්ධව විස්තර ලබාගැනීමට, EIS පද්ධතියට ඇතුල් වී විස්තර ගන්නා ලෙසත් දන්වමි.

4. මෙම සකස් කරන පවුල් සංවර්ධන සැලැසුම් වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරීන් භාරයේ තබාගැනීම ද සිදු කලයුතුය.

**vii. හඳුනාගත් ප්‍රතිලාභීන්ගේ ලේඛනය ප්‍රජා සංවර්ධන සභාවට (CDC) ඉදිරිපත් කිරීම**

1. ඉහත අංක vi සඳහන් පරිදී හඳුනාගත් ප්‍රතිලාභීන් ගේ මූලික තොරතුරු හා පවුල් සංවර්ධන සැලැසුම් විස්තර තොරතුරු කළමනාකරන පද්ධතියට(EIS) ඇතුල් කල යුතුය.

2. ඉන් අනතුරුව, සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් EIS පද්ධතියේ වාර්තාවන් වලට පිවිස සවිබලගන්වන මානය නමින් ඇති වාර්තාවේ පිටපතක් ගෙන ග්‍රාම නිළධාරි වසමේ **ප්‍රජා සංවර්ධන සභාවේ (CDC)** දැනගැනීමට ඉදිරිපත් යුතුය.

**viii.** **සම්පූර්ණ කරන ආකෘතීන් මුද්‍රණය හා වියදම් දැරීම.**

1. ආකෘතීන් මුද්‍රණය දිස්ත්‍රික් සමෘද්ධි අංශය/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කර අවශ්‍ය පිටපත් ප්‍රමාණය ක්ෂේත්‍රගත නිළධාරීන් වෙත ලබාදීම සිදු කල යුතුය.
2. එක් ආකෘති කට්ටලයක් (ඇමුණුම 1 හා 03) මුද්‍රණය සඳහා රු.20/- මුදලක් ලබා දීමට කටයුතු කරනු ලබයි.
3. ආකෘති පත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් සමෘද්ධි අංශය ලබාදීම සිදු කරයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මුද්‍රණ කටයුතු සිදුකරන අවස්ථාවක දිස්ත්‍රික් සමෘද්ධි අංශයෙන් ප්‍රතිපාදන ලබාගත යුතුය.

**03.** හඳුනාගත් පවුල් සඳහා රැස්කරන මූලික තොරතුරු හා පවුල් සංවර්ධන සැලසුම් පිළිබඳ තොරතුරු , තොරතුරු කළමනාකරන පද්ධතියට (Empower IS ) ඇතුලත් කල යුතුය. මේ සඳහා නිළධාරීන්ගේ ස්මාර්ට් වර්ගයේ ජංගම දුරකථන හෝ සමෘද්ධි බැංකු/බැංකු සමිති වල අන්තර් ජාල පහසුකම් සහිත desktop පරිගණක භාවිතා කර මෙම තොරතුරු හා විස්තර ඇතුලත් කිරීම කල යුතුය.

**04.** සුදුසු පවුල් හඳුනාගැනීම, පවුල් සංවර්ධන සැලැසුම් පිළියෙල කිරීම හා ප්‍රතිලාභ තොරතුරු කළමනාකරන පද්ධතියට ඇතුලත් කිරීම ඇතුළු සියළුම කටයුතු 2025.02.15 දිනට පෙර නිමකිරීම අනිවාර්යය බවද දන්වමි.

**05.** හඳුනාගත් පවුල් සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, ස්වයං රැකියා හා රැකියා අවස්ථාව/ වෘත්තීය පුහුණුව සඳහා මූල්‍යාධාර පහසුකම් ලබාදීම, සමෘද්ධි සවිබල -ii ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම,සමෘද්ධි බැංකු අනිකුත් ණය වැඩසටහන් යටතේ ණය ලබාදීම හා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආදාල උපදෙස් ලබාදීම එක් එක් සංවර්ධන අංශ විසින් සිදු කිරීමට නියමිතය.

**06.** හඳුනාගත් ප්‍රතිලාභියා හෝ පවුලේ සමාජිකයෙකු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ හා සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකත්වය දැනටමත් ලබාගෙන නොමැති නම්, ඉදිරියේදී සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු සිදුකරන ලෙසත් දන්වමි.

**07.** අස්වැසුම ප්‍රතිලාභ නොලබන (සමෘද්ධි සහනාධාර ලැබූ) අඩු ආදායම්ලාභී පවුල් 2026 වර්ෂය සඳහා සවිබලගැන්වීම් වැඩසටහනට තෝරා ගැනීම සිදු නොවන අතර, 2025 වර්ෂයේ හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා ආර්ථික, සාමාජික හා මානසික ක්ෂේත්‍රයන් යටතේ ක්‍රියාත්මක වැඩසටහන් දි ඇති චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙස දන්වමි.

**08.** මෙම කාර්යයට සම්බන්ධ කරගන්නා දිස්ත්‍රික්, ප්‍රාදේශීය, කලාප හා වසම් මට්ටමේ සියළුම නිළධාරීන්ට වැඩසටහන ක්‍රියාත්මක කිරීම , අධීක්ෂණය කටයුතු පිළිබඳ දැනුවත් කිරීම හා උපදෙස් ලබාදීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් හා ප්‍රා දේශීය ලේකම්වරුන් විසින් සිදු කරන ලෙසත් දන්වමි.

මෙම කාර්යය සඳහා ප්‍රමුඛතාවය ලබා දී, කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත්:-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය -කා.දැ.ස
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- (සැලසුම්), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- (සංවර්ධන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
4. සියළුම අංශ ප්‍රධානින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
5. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
7. මූලස්ථාන/ සමෘද්ධි බැංකු සමිති/ ව්‍යාපෘති / සමෘද්ධි බැංකු කළමණාකරුවන් -අ.ක.ස